සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது.
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - කොළඹ අධ්‍යාපන කලාපය
மேல் மாகாணக் கல்வித் திணைக்களம் - கொழும்பு கல்வி வலயம்
Western Province Education Department - Colombo Educational Zone

දෙවන වාර ඇගයීම
இரண்டாம் தவணை பதிப்பீடு - 2015
Second Term Evaluation

ශ්‍රේණිය தரம் Grade	විෂයය பாடம் Subject	පත්‍රය வினாத்தாள் Paper	පැය மணித்தியாலம் Hours
11	චිත්‍ර කලාව	I	01

සැලකිය යුතුයි:
(i) සියලු ම ප්‍රශ්නවලට මෙම ප්‍රශ්න පත්‍රයේම පිළිතුරු සපයන්න.

Ÿ පහත දැක්වෙන ඡායාරූපය ඇසුරු කරගෙන අංක 01 සිට 05 දක්වා දී ඇති වාක්‍යවල හිස්තැන් සඳහා නිවැරදි පිළිතුරු සපයන්න.

(01) දේශීය විහාර බිතු සිතුවම් කලාවෙහි අග්‍රගන්‍ය නිර්මාණයක් ලෙස සැලකෙන මෙම චිත්‍රය ..... හි දක්නට ඇති බිතු සිතුවමකි.

(02) මෙය ..... යුගයේ චිත්‍ර කලා සම්ප්‍රදාය අනුව අඳින ලද චිත්‍රයක් ලෙස සැලකේ.

(03) සිතුවමින් නිරූපිත තේමාව ..... ලෙස නම් කර ඇත.

(04) මෙම චිත්‍රය ..... ශිල්ප ක්‍රමය අනුව නිර්මාණය කර ඇති බව විද්වත් මතයයි.

(05) මෙම සිද්ධස්ථානයෙහි..... කොටසේ හමුවන ජාතක කථා සිතුවම් මහනුවර ගම්පල චිත්‍ර කලා සම්ප්‍රදායට නැකම් කියන බව කලා විචාරකයින්ගේ අදහසයි.

Ÿ අංක 06 සිට 10 දක්වා දී ඇති ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු සපයන්න.

(06) ලාංකීය බෞද්ධ පුනර්ජීවනය සඳහා නව ආරක බෞද්ධ සිතුවම් කලාවක් අරඹමින්,දේශීය බෞද්ධ විහාර චිත්‍ර කලාව නව මගකට යොමු කළ කොළඹ යුගයේ සිටි චිත්‍ර ශිල්පියා කවු ද? .....

(07) දකුණු ඉන්දීය විජයනගර් ගෘහ නිර්මාණ ලක්ෂණ අනුව ගම්පල යුගයේ, තනි කළු ගලින් ඉදිකර ඇති ප්‍රතිමාඝරය හඳුන්වන්න. .....

(08) භාරත ඉතිහාසයේ භාව ප්‍රකාශනය අතින් ඉතා උසස් කලා නිර්මාණයක් ලෙස සැලකෙන සාරානාත් බුද්ධ ප්‍රතිමාවෙහි දක්නට ලැබෙන ආසන ක්‍රමය කුමක් ද? .....

(09) බුදුන් වහන්සේ බුද්ධත්වය ලද බවට මහී කාන්තාව සාක්ෂි දරණ බව පෙන්වීම සඳහා මහනුවර යුගයේ බුද්ධ ප්‍රතිමා නිර්මාණයේදී බහුලව යොදාගත් මුද්‍රාව නම් කරන්න. .....

(10) ඉන්දු නිම්න ශිෂ්ටාචාර වැසියන් ලෝහ වාත්තු ශිල්පය පිළිබඳ මනා පරිචයක් දක්වූ බවට සාධක සපයන, මෙහෙන්දජාරෝවෙන් හමු වූ අගනා මූර්තිය කුමක්ද? .....

Ÿ අංක 11 සිට 15 තෙක් දී ඇති ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(11) හින්දු බැතිමතුන්ගේ ප්‍රධාන දෙවිකෙනෙකු වන'' ගනේෂ''

(i) නර්තනයට අධිපති දෙවියන් ලෙස සැලකේ.

(ii) ඥානයට හා අක්ෂර මාලාවට අධිපති දෙවියන් ලෙස සැලකේ.

(iii) යුද්ධයට අධිපති දෙවියන් ලෙස සැලකේ.

(iv) ප්‍රේමය හා ආදරයට අධිපති දෙවියන් ලෙස සැලකේ.

(12) අතීතයේ දී පයින් ගමන් ගත් ජනයා, විඩාව නිවා ගැනීම සඳහා භාවිත කළ පනාවිටිය ගමෙහි අම්බලමේ දක්නට ලැබෙන කලාත්මක කැටයම්

(i) ජන ජීවිතයේ විවිධ සිදුවීම් තේමා කරගෙන, අල්පොන්නතව නෙළා ඇත.

(ii) සාම්ප්‍රදායික සත්ව රූප පමණක් තේමා කරගෙන,අල්පොන්නතව නෙළා ඇත.

(iii) ජන ජීවිතයේ විවිධ සිදුවීම් තේමා කරගෙන පූර්ණ උන්නතව නෙළා ඇත.

(iv) උද්භිද හා නිර්ජීව් මෝස්තර තේමා කරගෙන අර්ධ උන්නතව කැටයම් කර ඇත.

(13) 20 වන සියවසෙහි ශ්‍රී ලංකීය සිතුවම් කලාවේ පුරෝගාමී චිත්‍ර ශිල්පියෙකු ලෙස සැලකෙන A.C.G.S අමරසේකර මහතා

(i) වියුක්තරූපී කලා සම්ප්‍රදායෙහි සිද්ධාන්ත භාවිත කරමින් චිත්‍ර නිර්මාණය කළ ශිල්පියෙකි.

(ii) යුරෝපයේ ශාස්ත්‍රාලයීය චිත්‍ර කලා ප්‍රවණතාවයන් අනුගමනය කරමින් චිත්‍ර නිර්මාණය කළ ශිල්පියෙකි.

(iii) තෙල් සායම් හා දිය සායම් මාධ්‍ය භාවිත කරමින් ප්‍රතිරූප චිත්‍ර පමණක් නිර්මාණය කළ ශිල්පියෙකි.

(iv) දේශීය අනන්‍යතාවයෙන් යුතුව බෞද්ධ විහාර සිතුවම් රැසක් නිර්මාණය කළ ශිල්පියෙකි

(14) ග්‍රැෆික් සැලසුම් ගණයට අයත් ලාංඡනයක් නිර්මාණය කිරීමේදී ඔබ විසින් වඩාත් අවධානය යොමු කළ යුත්තේ,

(i) පැහැදිලි බව, සරලබව, හා සංකේතාර්ථ නිරූපණය කිරීමටය.

(ii) සංකීර්ණ හැඩතල හා නිර්මාණාත්මක අක්ෂරකරණය සඳහාය

(iii) දීප්තිමත් වර්ණ මාලාවක් භාවිත කිරීම කෙරෙහිය

(iv) සාම්ප්‍රදායික සැරසිලි මෝස්තර බහුලව භාවිත කිරීම් කෙරෙහිය

(15) දම් පැහැයෙන් යුතු පසුබිමක කහ පැහැයෙන් යුතු මල් සැරසිලි යොදා ඇති චිත්තයක්, සුජානි මිළදී ගත්තාය. මෙහි යොදා ගෙන ඇති වර්ණ අයත්, වර්ණ කාණ්ඩය වනුයේ

(i) මූලික වර්ණයයි

(ii) ද්විතියික වර්ණයයි

(iii) සංගත වර්ණයයි

(iv) විසංගත වර්ණයයි

Ÿ අංක 16 සිට 20 තෙක් දී ඇති රූප සටහන් වලට වඩාත් සෘජු සබඳතාවයක් දක්වන රූපය **A,B,C,D,E** අතරින් තෝරා එහි අක්ෂරය තිත් ඉරමත ලියන්න.

(16) .....

(17) .....

(18) .....

(19) .....

(20) .....

(A)

(B)

(C)

(D)

(E)

Ÿ අංක 21 සිට 25 දක්වා දී ඇති වාක්‍යවල හිස්තැනට සුදුසු නිවැරදි පිළිතුර යොදා හිස්තැන් පුරවන්න.

(21) ළමා ග්‍රන්ථ සඳහා සන්නිදර්ශන චිත්‍ර රැසක් නිර්මාණය කළ, බතික් චිත්‍ර කලාව සඳහා විශේෂ දක්ෂතා දැක්වූ ..... ශිල්පියා ලාංකීය චිත්‍ර කලා අධ්‍යාපන නිලධාරියකු ලෙසද විශේෂ සේවාවක් ඉටු කර ඇත.

(22) මහනුවර දළදා මාළිගාවේ දක්නට ලැබෙන දේවේන්ද්‍ර මුලාචාරීන් විසින් නිර්මාණය කර ඇතැයි සැලකෙන ..... ලක්දිව ගෘහ නිර්මාණ අතර දක්නට ඇති දුර්ලභ නිර්මාණයකි.

(23) රෆායෙල් විසින් අඳින ලද පෞරාණික ග්‍රීසියේ දාර්ශනික දිවි පෙවෙත නිරූපණය වන '' ඇතැන්ස් ගුරු කුලය'' නම් චිත්‍රය ඇඳ ඇත්තේ .....නමැති ගොඩනැගිල්ලෙහිය.

(24) ඇම්බැක්ක දේවාලයේ වහල නිර්මාණයේ සුවිශේෂ ලක්ෂණයක් වන පරාළ 26ක් එක් දැව ඇණයකින් රඳවා ඇති ස්ථානය ..... යන නමින් හැඳින්වේ.

(25) ඉසුරුමුණි විහාරයේ ඇති දියනාන ඇත් රූප කැටයම් සමූහය නිර්මාණය සඳහා ඉන්දියාවේ ..... කලාවෙහි ආභාෂය ලැබී ඇති බව කලා විචාරකයින්ගේ අදහසයි.

Ÿ අංක 26 සිට 30 තෙක් දී ඇති ප්‍රශ්න සඳහා **F,G,H,I.J** යන රූප සටහන් ඇසුරින් පිළිතුරු සපයන්න.

F

G

H

I

J

(26) F අකුරින් දක්වෙන විසිවන සියවසේ පෙර අපර දෙදිග කලා ශෛලීන් එකට මුහුකර ලාංකීය විහාර චිත්‍ර කලාව නව මගකට යොමු කළ ශිල්පියෙකුගේ නිර්මාණයකි. එම ශිල්පියා කවු ද? .....

(27) G අකුරින් දක්වෙන ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් සිතුවම උපුටාගෙන ඇත්තේ කිනම් ස්ථානයකින් ද? .....

(28) H අකුරින් දක්වෙන සුප්‍රකට ලලනා රූපය කුමන කලා සම්ප්‍රදායක් නියෝජනය කරයි ද? .....

(29) I අකුරින් දක්වෙන වාස්තු විද්‍යාත්මක නිර්මාණය කුමන ආගමකට අයත් ද? .....

(30) J අකුරින් දක්වෙන අල්ප උන්තක කැටයම ප්‍රදර්ශනය කර ඇති ස්ථානය කුමක් ද? .....

Ÿ අංක 31 සිට 35 දක්වා දී ඇති වචන වල <u>අර්ථය මැනවින් පැහැදිලි වන සේ</u> සම්පූර්ණ වාක්‍ය බැගින් ලියන්න.

(31) ආකාශ පර්යාලෝකය - .....

(32) පන්නම් කළාල - .....

(33) සකපෝරුව - .....

(34) ක්ෂයවෘද්ධි - .....

(35) ටැම්පිට විහාර - .....

Ÿ මෙහි දක්වෙන සිතුවම හඳුනාගෙන එහි කලාත්මක අගය විග්‍රහ වන පරිදි අංක 36 සිට 40 දක්වා දී ඇති උපමාතෘකා වලට අදාළව අර්ථවත් වාක්‍ය පහක් ලියන්න

(36) හඳුනාගත් බව :- .....
.....

(37) ශිල්පියා :- .....
.....

(38) තේමාව :- .....
.....

(39) මාධ්‍ය හා ශිල්ප ක්‍රමය .....
.....

(40) ශෛලීය :- .....
.....

(ලකුණු 1 × 40 = 40)

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது.
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - කොළඹ අධ්‍යාපන කලාපය
மேல் மாகாணக் கல்வித் திணைக்களம் - கொழும்பு கல்வி வலயம்
Western Province Education Department - Colombo Educational Zone

දෙවන වාර ඇගයීම
இரண்டாம் தவணை பதிப்பீடு - 2015
Second Term Evaluation

ශ්‍රේණිය தரம் Grade	විෂයය பாடம் Subject	පත්‍රය வினாத்தாள் Paper	පැය மணித்தியாலம் Hours
11	චිත්‍ර කලාව	II	02

සැලකිය යුතුයි:

(i) විභාග ශාලාධිපති සඳහා උපදෙස් පත්‍රිකාව

- **නිදහස් රේඛාමය ඇඳීම හා වර්ණ චිත්‍ර සම්පිණ්ඩනය**

සපයාගත යුතු ද්‍රව්‍ය

(1) විහිදිගිය අඹ කොළ අත්තක්

(2) වීදුරුවක් (අඩක් චතුර පිරවූ) (අඟල් 5ක් පමණ උස)

(3) දොඩම් ගෙඩියක්

(4) මැටි කළයක්

(5) කාඩ්බෝඩ් පෙට්ටියක් (අවශ්‍ය පරිමාණයට ගැලපෙන පරිදි)

(6) වර්ණ රෙදි කැබැල්ලක්

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது.
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - කොළඹ අධ්‍යාපන කලාපය
மேல் மாகாணக் கல்வித் திணைக்களம் - கொழும்பு கல்வி வலயம்
Western Province Education Department - Colombo Educational Zone

දෙවන වාර ඇගයීම
இரண்டாம் தவணை பதிப்பீடு - 2015
Second Term Evaluation

ශ්‍රේණිය தரம் Grade	11	විෂයය பாடம் Subject	චිත්‍ර කලාව	පත්‍රය வினாத்தாள் Paper	II	පැය மணித்தியாலம் Hours	02

සැලකිය යුතුයි:

(i) ඔබේ විභාග අංකය / නම හා පන්තිය උත්තර පත්‍රයේ පසු පිටෙහි ලියන්න.

- නිදහස් රේඛාමය ඇඳීම හා වර්ණ සම්පිණ්ඩනය
- ඔබ ඉදිරියේ තබා ඇති ද්‍රව්‍ය සමූහය හොඳින් නිරීක්ෂණය කරන්න.

(1) රළු කඩදාසියක් මත රේඛා මගින් පූර්ව අධ්‍යයනයක යෙදෙන්න. (මෙම රේඛා අධ්‍යයනය සඳහා ද ලකුණු හිමිවේ)

(2) ද්‍රව්‍ය සමූහය ඔබට පෙනෙන අයුරින් වර්ණ කිරීමට සුදුසු චිත්‍ර කඩදාසියක ඇඳ වර්ණ ගන්වන්න.

- චිත්‍ර දෙකම එකට අමුණා ශාලාධිපතිට භාර දෙන්න.
- ඔබේ චිත්‍රය ඇගයීමේ දී පහත සඳහන් කරුණු පිළිබඳව සැලකිලිමත් වේ.

1. රේඛා අධ්‍යයනයේ දී දක්වන කුසලතා

2. වර්ණ චිත්‍රය

- ද්‍රව්‍ය සමූහය තලය මත කලාත්මකව සම්පිණ්ඩනය කිරීම
- පරිමාණය, පර්යාලෝක රීති, ත්‍රිමාණ ලක්ෂණ දැක්වීම
- දෙන ලද ද්‍රව්‍ය සමූහයේ මතු පිට ස්වභාවය හා ගති ලක්ෂණ දැක්වීම
- වර්ණ හැසිරවීමේ ශිල්පීය කුසලතාව
- උචිත පසුබිමක් යෙදීම හා සමස්ත නිමාව

සැලකිය යුතුයි

ද්‍රව්‍ය සමූහය තබා ඇති ලෑල්ල ගැලපෙන අයුරින් වෙනස්කර ඇඳීමට ඔබට අවසර ඇත.

(ලකුණු 30)

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது.
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - කොළඹ අධ්‍යාපන කලාපය
மேல் மாகாணக் கல்வித் திணைக்களம் - கொழும்பு கல்வி வலயம்
Western Province Education Department - Colombo Educational Zone

දෙවන වාර ඇගයීම
இரண்டாம் தவணை பதிப்பீடு - 2015
Second Term Evaluation

ශ්‍රේණිය தரம் Grade	11	විෂයය பாடம் Subject	චිත්‍ර කලාව	පත්‍රය வினாத்தாள் Paper	III	පැය மணித்தியாலம் Hours	02

- සැලකිය යුතුයි

✓ ඔබ ඇඳිය යුත්තේ එක් චිත්‍රයක් පමණි.

✓ ඔබේ විභාග අංකය / නම පංතිය හා අදාළ ප්‍රශ්න අංකය උත්තර පත්‍රයේ පසුපිටේ පැහැදිලිව ලියන්න.

✓ උත්තර පත්‍රය විභාග ශාලාධිපතිට භාරදෙන විට වියලී තිබිය යුතු ය. තෙත චිත්‍ර ඇලී නිබීම ඔබට අවාසිදායක විය හැකිය.

✓ දිය සායම්, පෝස්ටර් සායම්, පැස්ටල් ආදී අතේ නොගැවෙන ඕනෑම මාධ්‍යයක් වර්ණ කිරීම සඳහා භාවිත කළ හැකිය.

'අ' කොටසින් හෝ 'ආ' කොටසින් හෝ 'ඉ' කොටසින් එක් මාතෘකාවක් පමණක් තෝරා ගන්න.

'අ' කොටස - චිත්‍ර සංරචනය

(1) බැති සිතින් ආගමික වතාවත් වල නියැලෙන බැතිමතුන් පිරිසක්

(2) දිය පිරි විලක් අසබඩ මුව රංචුවක්

(3) දුම්රිය එනතුරු

(4) වෛද්‍ය සායනයක්

- හෝ -

'ආ' කොටස - ග්‍රැෆික් චිත්‍ර

(4) 'ළමා අයිතින් සුරකිමු' යන තේමාව යටතේ පෝස්ටර් චිත්‍රයක්

(5) නවතම බැංකු සේවාවක් සඳහා උචිත ලාංඡනයක්

(6) ' ශ්‍රී ලංකාවේ ජන කලා' යන මැයෙන් රචිත පොතක් සඳහා උචිත පිටකවරයක්

- හෝ -

'ඉ' කොටස - මෝස්තර නිර්මාණ

(7) සංචාරක හෝටලයක ඉදිරිපස අලංකාරය සඳහා සාම්ප්‍රදායික සැරසිලි ඇසුරින් නිර්මාණය කළ පතාකයක්.

(8) චතුරස්‍රාකාර කුෂන් කවරයක් සඳහා නිර්මාණාත්මක හැඩයතල ඇසුරින් මුලුතල මෝස්තරයක්

(9) මල්, කොළ, ආදී ශාකමය කොටස් ඇසුරින් ගවුම් රෙද්දක් සඳහා උචිත වතප්ත මෝස්තරයක්

(ලකුණු 30)